## 499 මුතු කැට සොයනට

මුතු කැට සොයනට ඇයි වෙහෙසෙන්නේ
මුතු එකමුතු බව නොමැතිද දන්නේ
ලක් මව දියුණුව අප අත වන්නේ
කිතු තුම ගය මග අපි යන්නේ

එක පවුලක දරුවන් ලෙස අපි සැම
කිසි විට නැහැ පසු බට වන්නේ
කිතු දම දස අත පතුරන විලසින
අත්වැල් බැඳ පෙරටයි එන්නේ

මිතුරන් සමගින දුක සැප බෙදමින
දියුණුවටයි අපි අත දෙන්නේ
සතුරන් අපහට නැත කිසිවිට ලොව
සාමෙන් අපි ජීවත් වන්නේ

සමිඳුන් අපහට දී ඇති ශක්තිය
යොදමින් හෙළ බිම සුරකින්නේ
අද දින අපහට ලැබෙනා දුක සැප
දෙව් සමිඳුන්ටයි පුද දෙන්නේ